# ලංකා බැංකුව

**ශ්‍රී ලංකාවේ අංක 1 බැංකුව හා එක්ව ශක්තිමත් වෘත්තියක් ආරම්භ කරන්න !**

බැංකු ක්ෂේත්‍රයෙන් ඉදිරියට යාමට අපේක්ෂාකරන සුදුසුකම් ලත්, තරුණ, උද්‍යෝගිමත් මෙන්ම අරමුණු වෙත හඹායන පුද්ගලයන්ගෙන් පහත දැක්වෙන තනතුර සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ:

## අභ්‍යාසලාභී මාණ්ඩලික සහකාර

### යෝග්‍යතා නිර්ණායක

➢ **ශ්‍රී ලාංකීය පුරවැසියකු විය යුතුය.**

➢ **සුදුසුකම්**

- අ.පො.ස. (සා/ පෙළ) විභාගයේදී මව්බස, ගණිතය සහ ඉංග්‍රීසි භාෂාව ඇතුළු විෂයයන් පහකට (5 කට) සම්මාන සාමාර්ථ සහිතව එක් වරකදී විෂයයන් හයකින් (6 කින්) (අතිරේක විෂයයන් හැර) සමත් වී තිබීම.

**සහ**

- අ.පො.ස (උ/ පෙළ) විභාගයේදී විෂයයන් තුනිකන් (03 කින්) (සාමාන්‍ය ඉංග්‍රීසි, සාමාන්‍ය දැනුම හා සාමාන්‍ය තොරතුරු තාක්ෂණය හැර) එක් වරකදී සමත්වී තිබීම.

➢ **වෙනත් සුදුසුකම්**

- ඉහළ මට්ටමේ අන්තර් පුද්ගල සම්බන්ධතා සහ සන්නිවේදන හැකියාව
- දැඩි උත්සාහය සහ කැපවීම සහිත පුද්ගලයකු වීම.
- කාලානුබද්ධ ඉලක්ක අනුව සේවය කිරීමේ හැකියාව.

➢ **වයස**

අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 24ක් හෝ ඊට අඩු විය යුතුය.

### නියමයන් හා කොන්දේසි

■ පුහුණු කාලසීමාව වසර දෙකක් වන අතර මෙම පුහුණු කාලය තුළ මාසික දීමනාවක් (පළමු වසර සඳහා - මසකට රු.55,000/- ක් ද දෙවන වසර සඳහා - මසකට රු.70,000/- ක් ද) ගෙවනු ලැබේ.

■ මෙම තනතුර බැංකු සේවයේ සාමාන්‍ය නියමයන් හා කොන්දේසිවලට යටත් වන අතර සාමාන්‍ය බැංකු සේවා ධාරාවට (විවෘත සේවය) ඇතුළත් වේ.

■ පුහුණු කාලසීමාව තුළ බැංකුව සෑහීමකට පත්වන ආකාරයට අවශ්‍යතා සපුරාලීම මත ස්ථිර සේවයෙහි මාණ්ඩලික සහකාර - 1 ශ්‍රේණියෙහි ස්ථිර කරනු ලැබේ.

■ කාර්යාල වේලාවෙන් පසුව සහ සති අන්ත/නිවාඩු දිනවල සේවය කිරීම අපේක්ෂා කෙරේ.

■ කළමනාකාරීත්වය විසින් වෙනත් ආකාරයකින් තීරණය කරනු ලැබුවහොත් මිස, අභ්‍යාසලාභීන් අවම වශයෙන් වසර පහක (05) අනිවාර්ය කාල සීමාවක් (පුහුණු කාලය ඇතුළුව) තමාව අනුයුක්ත කර ඇති පළාතේ සේවය කළ යුතුය.

### තෝරා ගැනීමේ පටිපාටිය

■ තරඟ විභාගයකින් අනතුරුව ලැයිස්තුගත කරනු ලබන (shortlisted) අපේක්ෂකයන් සඳහා පැවැත්වෙන සම්මුඛ පරීක්ෂණයක්/ පරීක්ෂණ මගින් තෝරාගනු ලැබේ.

■ තෝරාගැනීම් අදාළ පළාත්වල අවශ්‍යතා මත පදනම් වේ.

■ පහත සඳහන් ප්‍රශ්න පත්‍ර විභාගයේදී සලකා බලනු ලැබේ:

I වන ප්‍රශ්න පත්‍රය - සාමාන්‍ය දැනීම, බුද්ධි පරීක්ෂණය සහ තොරතුරු තාක්ෂණය

II වන ප්‍රශ්න පත්‍රය - ඉංග්‍රීසි භාෂාව

■ තරඟ විභාගයෙන් ලබාගත් ලකුණු සම්මුඛ පරීක්ෂණය සඳහා අපේක්ෂකයන් ලැයිස්තුගත කිරීම සඳහා පමණක් භාවිතා කරනු ලැබේ. අවසාන තෝරාගැනීම් සිදුකරනු ලබන්නේ සම්මුඛ පරීක්ෂණයේදී ලබා ගන්නා ලකුණු මත පමණක් පදනම්ව ය.

### අයදුම් කිරීමේ පටිපාටිය

■ ඔබේ අයදුම්පත අපගේ වෙබ් අඩවිය වන www.boc.lk ("careers" තීරය) හරහා **2025.05.24 වන දින හෝ ඊට පෙර** ඉදිරිපත් කරන්න. ඉදිරි කටයුතු සඳහා "අයදුම්පතේ යොමු අංකය" ඔබේ ළඟ තබාගන්න.

■ කරුණාකර **Careers Page** හි ඇති 'අපේක්ෂකයන් සඳහා වන උපදෙස්' සැලකිල්ලෙන් යුතුව කියවා, දී ඇති උපදෙස් අනුව මාර්ගගත අයදුම්පත සම්පූර්ණ කරන්න.

■ අපේක්ෂකයන් තමන් කැමති එක් පළාතක් පමණක් තෝරා ගත යුතු අතර, යම් අපේක්ෂකයකු පළාත් එකකට වඩා තෝරාගන්නේ නම්, ඔහුගේ/ඇයගේ අයදුම්පත නුසුදුසු ලෙස සලකනු ලැබේ.

■ ඉහත ක්‍රමයෙන් හැර වෙනත් ක්‍රමවේදයන්ගෙන් ලැබෙන අයදුම්පත් කුමන හේතුවක් මත හෝ භාරගනු නොලැබේ.

■ ඉල්ලුම්පත් භාරගන්නා අවසන් දිනට ඉහත නියමිත යෝග්‍යතා නිර්ණායක සපුරා නොමැති හෝ සාවද්‍ය තොරතුරු ඉදිරිපත් කරන හෝ ඕනෑම ඉල්ලුම්පතක් බඳවා ගැනීමේ ඕනෑම අදියරකදී කිසිඳු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. යම් අයදුම්කරුවකු විසින් සහතික පරීක්ෂා කරන අවස්ථාවේදී ඉහත නියමිත යෝග්‍යතා නිර්ණායක සනාථකිරීම සඳහා ලේඛනමය සාක්ෂි ඉදිරිපත් කිරීමට අපොහොසත් වුවහොත්, ඔහුගේ/ඇයගේ අයදුම්පත වහාම ප්‍රතික්ෂේප කරනු ලැබේ.

■ ඉල්ලුම්කරු විසින් අපගේ වෙබ් අඩවියේ (https://www.boc.lk/hr-management) ඔස්සේ පිවිසිය හැකි මානව සම්පත් කළමනාකරණ පිටුවේ ඇති "බඳවාගැනීම් සඳහා වන පෞද්ගලික දත්ත ආරක්ෂණ දැන්වීම" ඉල්ලුම්කරන අවස්ථාවේදී කියවා එය පිළිගත යුතුය.

**මානව සම්පත් අංශය,**
**ලංකා බැංකුව,**
**ප්‍රධාන කාර්යාලය,**
**කොළඹ 01.**

■ බැංකුව වෙත කුමන අයුරකින් හෝ බලපෑමක් කිරීම ඔබ මෙම තනතුර සඳහා වහාම නුසුදුසුභවට පත්කිරීමට හේතු වේ.

■ තෝරාගනු ලබන අයදුම්කරුවන් පමණක් කැඳවීමේ අයිතිය බැංකුව සතුය.

■ සම්පූර්ණ කළ යුතු තනතුරු සංඛ්‍යාව තීරණය කිරීමේ හෝ බඳවා ගැනීම කල් දැමීමේ/ අවලංගු කිරීමේ අයිතිය බැංකුව සතුය.

■ බැංකුවේ පෞද්ගලික දත්ත ආරක්ෂණ ප්‍රතිපත්තියට අනුව, බැංකුව විසින් ඔබේ තොරතුරුවල පෞද්ගලිකභාවය හා රහස්‍යභාවය ආරක්ෂා කරනු ලැබේ.